

# මගේ පුංචි ගෙවත්ත

එන්.පී. නෙසාකි යෙහන්සා ඉලංගකෝන්

**5 – A ශ්‍රේණිය**

# මගේ පුංචි ගෙවත්ත


**එන්.පී. නෙසාකි  යෙහන්සා ඉලංගකෝන්**


## කතෘගේ වෙනත් කෘති

- අක්කාගේ උපන්දිනය
- දහස්පෙතියා පැළය
- පුංචි නෙසාකිගේ පුංචි හොඳ වැඩේ


මහ/මහාමායා බාලිකා විද්‍යාලය

5 – A ශ්‍රේණිය


2026/06/19


**ISBN – 978 – 624 – 211 – 164 - 3**

# පිදුම

මාගේ ආදරණීය අම්මාටත්, තාත්තාටත්,

අක්කාටත් හා මා හට සිප්සතර ඉගැන්වූ

සියලුම ගුරුවරුන්ට ආදරයෙන් පුදමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍යා දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

මාගේ පාසැල තිබෙන්නේ මහනුවරය. මාගේ පාසැල පිහිටා ඇත්තේ ශ්‍රී දළදා මාලිගාව අසල ය. අම්මාත්, අප්පච්චිත්, අක්කාත් මාගේ නිවාඩු තිබෙන හැම දවසකම දළදා මාලිගාවට යනවා. සවසට ඒ අවට පරිසරය හරිම ලස්සනට පෙනෙනවා. හිතටද පුදුමාකර සතුටක් වගේම සැනසිල්ලක් ගෙන දෙනවා.



මාගේ පාසලේ ඉගෙන ගන්නා පන්තියේ ගුරුතුමිය දවසක් අපිට කිවුවා. බීජයක් සිටුවා එය හැදෙන හැටි බලා නිරීක්ෂණ කර බලා ලියන්න කියලා. ඉතින් අපි එය හැදෙන හැටි දවසින් දවස බලා එය නිරීක්ෂණය කළා. එවිට මගේ හිතේ ආසාවක් ඇතිවුණා. පැළයක් සිටවීමට ඉතින් මම මේ බව අප්පච්චිට කිවුවා. මිදුලේ පොඩි ඉඩක් තිබෙන නිසා අපි මිදුලේ එළවළු සිටවමු කියා. ඉන්පසු අප්පච්චි මට පොළට ගිහින් එළවළු ඇට සහ පොඩි උදැල්ලක් ද ගෙනවිත් දුන්නා.

හෙට සෙනසුරාදා නිසා අප්පච්චි ගෙදර ඉන්න දවසක්. “අපි හෙට උදෙන්ම පොළව ටිකක් කොටලා පස බුරුල් කර ගමු.” කියා අප්පච්චි කීවා. පසුදා උදෙන් මමත් අප්පච්චිත් සමඟ සතුටින් මාගේ පොඩි උදැල්ලක් ගෙන මිදුලේ පස් බුරුල් කර පොළව කොටා එළවළු ඇට සිටවූවා.




එළවළු ඇට සිටවිවාට පසු මමත්, අක්කාත් සමඟ පාසැල් යන්නට පෙර උදේ සිටවපු පැලවලට දින පතා වතුර දැම්මා. පාසැල් ගිහින් ඇවිත් සවසට ද සිටවපු ඇට වලට වතුර දාන්න අමතක කළේ නැහැ. සති දෙකක් තුනක් යනවිට සිටවපු ඇටවල කොළ දෙක දෙක ඇවිත් තිබෙන බව මම දැක්කා. මට එදා හරිම සතුටක් දැනුණා.



තව සති දෙකක් පමණ ගෙවී යනවිට කොළ තුන තුන ඇවිත් තිබෙනවා. මමත්, අක්කාත් හරිම සතුටුයි. අම්මාටත් අප්පච්චිත් අපිට වාගේම සතුටුයි කියා කිව්වා. අපිට කොච්චර වැඩ තිබුණානම් අපි උදේ සවස වතුර දාන්න අමතක කළේම නැහැ. උදේ සවස වතුර දැම්මා.



දවසින් දවස කොළ හතර පහ දළුලාගෙන එන විට අප්පච්චි කිව්වා. දැන් පැළවලට පොහොර ටිකක් දැම්මානම් හොඳයි කියලා ඉන් පසු අප්පච්චි අපිට වැඩට ගිහින් එන විට පොහොර පැකට් එකක් ගෙනවිත් දුන්නා. අප්පච්චි වැඩට යන නිසා වේලාවත් අඩුයි. ඒ නිසා මමත්, අක්කාත්, අම්මාත් එළවළු පැළවලට පොහොර ටික ඉතාමත් සතුටින් පැළවලට දැම්මා.



තවත් සතියක් දෙකක් ගෙවී යනවිට පැළවල කොළ දමා මල් ටික ටික එනබව පෙනුණා. අපිට දැන් හරිම සතුටුයි. අපි වෙනදා වගේ ම උදේ සවස වතුර දාන එක අමතක නොකර කළා.



තවත් දවස් ටිකක් ගෙවන විට මල්වල පොඩි පොඩි ගෙඩි ඇවිත් පෙනුණා. එදා නිවාඩු දවසක් නිසා. මම දුවගෙන අම්මාටත්, අප්පච්චිත් මේ බව කිවුවා. එයාලා දෙන්නාත් එලියට ඇවිත් බැලුවා. මමත් අක්කාත් සමඟ එළියට ඇවිත් සතුටින් අපි සිටවපු ගස් දිහා බලා සිටියා.



තවත් ටික කාලයක් ගෙවී යද්දී ගස්වල ගෙඩි ටික ටික ලොකු වී පාට වේගෙන එනබව පෙනුණා. අපිට නම් හරිම සතුටුයි. අපි අපේ ගෙදර මෙච්චර එළවළු වවන මුල්ම අවස්ථාව මේක නිසා. අපේ අප්පච්චි කිව්වා තව සති දෙකකින් විතර උයන්න එළවළු කඩා ගන්න පුළුවන් කියලා. එතකොට පොළේ ගිහින් අපිට එළවළු ගේන්න ඕනේ නැහැ කිව්වා.



සති දෙකකින් පමණ ගෙවී ගියා. අපේ එළවළු වගාවේ එළවළු අපි සියලු දෙනා එකතු වී සතුටින් තබා ගත්තා. හරිම ලස්සන නැවුම් එළවළු නේද දුව අප්පච්චිගෙන් ඇසුවා. ඔව් ලස්සන වාගේම මේ එළවළු ගුණදෙයක් මොකද මේ එළවළුවල බෙහෙත් දාලා නැහැ. වසවිෂ නැහැ. පොලේ ගෙනෙන එළවළුවල වසවිෂ ගොඩයි. ඒවා කෑවාම ශරීරයට ගොඩාක් ලෙඩ හැදෙනවා. ඒ නිසාඅපි හැම වෙලේම වවාගෙන කන්න පුළුවන්නම් ගොඩක් හොඳට කියා අප්පච්චි සිනාමුසු මුහුණින් කිවුවා. හරිම හොඳයි. අපි මේ එළවළු ඉවර වුණාම ආයෙත් සිටවමු. කියා අක්කාත්, මමත් කිවුවා. ඔව් ඒ වාගේම මේ එළවළු වලින් ටිකක් අපි අහල පහල අයට දෙන්න ඕනේ. අපි හැම වෙලේම බෙදාගෙනත් කන්න පුරුදු වෙන්න ඕනේ කියා අම්මාද සිනාමුසු මුහුණින් කිව්වා. හොඳයි

අපි එහෙනම් බෙදාගෙන කමු. කියා මමත්, අක්කාත්, අම්මාත්, අප්පච්චිත් සිනාවී අහල පහල අයටත් දුන්නා.



නිමි.

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)